# පොළොන්නරු යුගයේ ආගමික පසුබිම

## The religious background of the Polonnaruwa era

ආචාර්ය කුමාරි මදනායක

Abstract

11th and 12th Centuries are considered as Polonnaruwa period in history of Sri Lanka. There were number of rulers in Polonnaruwa period. According to Sāsanavansa and Mahavansa. There were various religious in that period. In addition to Buddhism there were number of religious as hindunism and worshiping of various Gods. Hindunism spared rapidly due to Chola invention to Sri Lanka. The Kings also in Polonnaruwa period supported the hindunism. As a result of that some of the rituals in hindunism mixed to Buddhism. The image of the bull appeared in the moonstone belongs to Anuradhapura period was removed from the moonstone belongs to Polonnaruwa period. As a result of influence of hindunism in Polonnaruwa period. The religion of Islam was prevailed in the areas of Colombo, Galle, Beruwala.The worshiping of Bodhisattawa was also appeared in the Pollonaruwa period. Some archaeological evidence have been discovered to confirm that there were Mahayana Buddhism also in the Polonnaruwa period. Critical study of primary and secondary sources has been used as a research method to collect the information. The main objective of this research is to discover various religious tradition prevailed in Pollonanaruwa period. Out of the religion prevailed in Polonnaruwa period hindunism had become more popular.

**Keywords:** Hindunism, Influence, Mahavansa, Polonnaruwa, Religious

**හැඳින්වීම**

ලංකා ඉතිහාසයේ දෙවන රාජධානිය ලෙස සඳහන් වන්නේ පොළොන්නරුව රාජධානිය යි. ක්‍රි. ව. 1056 සිට ක්‍රි.ව. 1236 දක්වා කාල පරිච්ඡේදයට අයත් වෙයි. මෙම කාල පරිච්ඡේදය තුළ පොළොන්නරුව පාලනය කළ රජවරු ලෙස පළමු වන විජයබාහු, පළමු වන ජයබාහු, පළමු වන වික්‍රමබාහු දෙවන ගජබාහු, පළමු වන පරාක්‍රමබාහු, දෙවන විජයබාහු, නිශ්ශංකමල්ල, දෙවන වික්‍රමබාහු, චෝඩගංග, ලීලාවතී රැජින, සහස්සමල්ල රජු, කල්‍යාණිවතී රැජින, ලෝකේශ්වර පණ්ඩු, මාඝ හා තෙවන විජයබාහු වැනි පාලකයන්ය.

පොළොන්නරු යුගයේ ආගමික පසුබිම ගැන විමසිමේදී එම යුගය තුළ ලංකාවේ ප්‍රධාන ආගම වූ බුදු දහම පැවතුණ අතර, දේශපාලන හා ආර්ථික අස්ථාවරභාවය හේතුවෙන් බුදු දහම තුළ පරිහානිකර අවස්ථා පැවතිණ. ශාසන චිරස්ථිතිය I වන විජයබාහු හා I වන පරාක්‍රමබාහු රජවරුන්ගේ කාල වකවානු වල පැවති බව පෙන්වා දිය හැකිය.  මානාභරණ රජුන්ගේ කාලයේ දී රජු විසින්ම බුදු දහමේ විනාශය උදෙසා කටයුතු කළ බව මහාවංශය දක්වා ඇත. මහායාන බුදු දහම ද පොළොන්නරු යුගයේ පැවති බව බෝධිසත්ත්ව ප්‍රතිමා හමුවිමෙන් හා ඇතැම් විහාර මහායාන සම්ප්‍රදායට අනුව නිර්මාණය කර තිබීමෙන් පැහැදිලි වේ.

පොළොන්නරුව යුගය තුළ ප්‍රබලව විරාජමාන වූ ආගමක් ලෙස හින්දු දහම පෙන්වා දිය හැකිය. හින්දු දහම යටතේ ශිව ලිංග වන්දනය, බ්‍රාහ්මණ ආගම, පත්තිනි ඇදහීම, පාර්වතී, නටරාජා වැනි දෙවියන් ඇදහීම සුලභ වශයෙන් දක්නට හැකි විය. හින්දු දහමේ ඇතැම් පුද පූජා ක්‍රම බුදු දහම සමඟ සම්මිශ්‍රණය වීමක් ද දක්නට ලැබේ. බෞද්ධ රජවරු පවා හින්දු දහමේ උන්නතිය උදෙසා කටයුතු කළ ආකාරය ඔවුන් විසින් සිදු කළ ආගමික කාර්යයන් පිළිබඳ විමසිමෙන් පැහැදිලි වේ.

කොළඹ, ගාල්ල, බේරුවල වැනි වරායයන් කේන්ද්‍ර කොට ගෙන ඉස්ලාම් ආගම ඇදහීම උදෙසා දේවස්ථාන ඉදි කරමින්, ඉස්ලාම් ආගම පොළොන්නරු යුගය තුළ ඇදහූ බව ද සඳහන් වේ. එකල රජවරුන් විසින් සෑම ආගමක් විෂයයෙහි අනුග්‍රහ දැක්වූ ආකාරය මහාවංශය, ශාසනවංශය හා චූලවංශය වැනි ග්‍රන්ථයන්හි දක්නට ලැබේ.

**සාකච්ඡාව**

I වන විජයබාහු රජු (ක්‍රි. ව. 1055 සිට 1110) විසින් ලංකාව සොලීන්ගෙන් මුදවා ගන්නා ලද අතර, පසුව බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා කටයුතු කරන ලදි. පොළොන්නරුව යුගයේ ආගමික තත්ත්වය පිළිබඳ විමසීමේ දී මේ වන විටත් බුදු දහම පිරිහෙමින් පැවති බව විජයබාහු රජු විසින් ශාසන සංශෝධනයක් කිරිමෙන් පැහැදිලි වේ. ඒ අනුව විජයබාහු රජු බුදු සසුනේ චිරස්ථිතිය සඳහා සිල්වත් භික්ෂූන් සොයන්නට වූ නමුත් ගණ පූරණයට අවශ්‍ය සිල්වත් භික්ෂූන් පස් නමක් වත් නැති තරමට ශාසනික තත්ත්වය පිරිහී තිබුණි. බුරුම රටින් සිල්වත් භික්ෂූන් ගෙන්වා පැවිදි උපසම්පදා ඇති කරන ලදි. භික්ෂූන් වහන්සේලාට ධර්ම කාරණා උගෙනීම සඳහා අවශ්‍ය පොත් පත් පවා බුරුමයෙන් ගෙන්වන ලදි. විජයබාහු රජතුමා ත්‍රිපිටකය ලියවා, භික්ෂූන් අතර බෙදා දුන් බව ද සඳහන්වේ. (ධම්මවිසුද්ධි හිමි, 1995, පි. 25, 28 ) I වන විජයබාහු රජතුමා විසින් ශාසනික දියුණුව විෂයයෙහි සිල්වත් භික්ෂූන් ඇති කිරීම, විහාරස්ථාන ගොඩනැගීම සහ ප්‍රතිසංස්කරණය කිරීම, ප්‍රත්‍යලාභ ඇති කිරීම, පොත් පත් සුලභ කිරීම වැනි කටයුතු සිදු කරන ලද බව දැක්වේ.

පොළොන්නරුවේ රජ පැමිණි රජවරුන් විසින් බුදු සමයේ උන්නතිය උදෙසා කටයුතු කිරීම අනිවාර්යය විය. රාජ්‍යත්වයට පත් වීම සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් බවට පත් වුයේ පාත්‍රා ධාතුන් වහන්සේ හා දන්ත ධාතුන් වහන්සේ තමා සන්තක වීමයි. ඒ නිසා කෙතරම් සොලී බලපෑම් තිබුණද, බුදු

දහම සුරක්ෂිතව පැවතිය යුතු විය. බොහෝ සතුරු බාධක හා විවිධ ආගම් හි ආගමනයත් සමඟම බුදු දහම සුරක්ෂිත වීමට හා බුදු දහම යාවත්කාලීන වීමට ද එම කරුණු හේතු වන්නට ඇත.

I වන විජයබාහු රජතුමා බුදු සසුනේ උන්නතිය උදෙසා කටයුතු කිරිමෙන් පසු රට තුළ තිබූ දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් බුදු දහම පරිහානියට පත් විය. මහා පරාක්‍රමබාහු රජු තුන් නිකායෙම භික්ෂූන් වහන්සේලා නියෝජනය වන පරිදී එක් ස්ථානයකට භික්ෂූන් වහන්සේලා කැඳවා සංඝ සාමග්‍රීය ඇති කිරීමට කටයුතු කරන ලදි. I වන පරාක්‍රමබාහු රජතුමාට රාජ්‍යය දිනා ගැනීමට වඩා භික්ෂූන් සමගි කිරීම දෙගුණයක් දුෂ්කර වූ බව දක්වා ඇත. ලජ්ජි, සුපේශල භික්ෂූන් වහන්සේලා ශාසනයේ රඳවා ගැනීමටත්, දුස්සීල, එහෙත් දැන උගත් අනෙක් පිරිස සිවුරු හරවා සසුනින් බැහැර කොට, රජයේ තනතුරු ප්‍රදානය කිරීමටත් රජු කටයුතු කර තිබේ. ශාසන ශෝධනයෙන් පසු වසරක් පාසා භික්ෂූන් වහන්සේලා ගංගා තීරයට වැඩමවා, උපස්ථාන කොට, ගඟ මැද නැව් යාත්‍රා සිටුවා, එහි මණ්ඩපයක් කරවා, භික්ෂූන්ට සිවුරු පිරිකර පූජා කොට, උපසම්පදා කර්මය සිදු කර වීය. මෙම උපසම්පදා කර්මය රජුගේ මැදිහත් විමෙන් සිදු කිරීම මඟින් නැවත ලාභාපේක්ෂාවෙන් කිසිවකුට සසුනට ඇතුළු වීමට තිබූ අවස්ථාව වැළැක්විය හැකි විය. (අබයරත්න, 2012, පි. 155) ශසනයේ චිරස්ථිතිය විෂයයෙහි සිදු කළ යුතු සියලුම කාර්යයන් රජතුමා විසින් සිදු කරන ලදි.

පළමුවන පරාක්‍රමබාහු රජු විසින් සුසිල්වත් භික්ෂූන්ගේ සුඛ විහරණය උදෙසා වෙහෙර විහාර කර වන ලද අතර මහා පරාක්‍රමබාහු රජතුමා විසින් නටබුන්ව තිබුණු ආගමික ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කරන ලදි. ඒ අතර ස්තූප 37ක් ද, මහපිළිම ගෙවල් 274ක් ද, ධර්මශාලා 29ක් ද, සංඝාවාස 126ක් ද, පොත් ගුල් 128ක් ද, දේව මන්දිර 24ක් ද, ප්‍රතිසංස්කරණය කරවන ලදි. (ධම්මවිසුද්ධි හිමි, 1955, පි 37)

ජේතවන නමින් මහාවිහාරයක් පොළොන්නරුවේ ඉදි කරවන මෙතුමා, ශාසනයේ පැවැත්ම උදෙසා, බොහෝ වෙහෙර

විහාර ඉදි කර වන ලදි. ඒවායින් කිහිපයක් පහත පරිදි සඳහන් කළ හැකිය.

- මෙම ජේතවන විහාරයට අයත් වූ, රජු විසින් ඉදි කරවන ලද ආගමික ගොඩනැගිලි රාශියක් මෙසේ දැක්විය හැකිය.
- අෂ්ටායතනවාසී භික්ෂූන් වහන්සේලා සඳහා තෙමහල් මහපා අටක් කරවීම.
- සාරිපුත්ත තෙරුන් වහන්සේ සඳහා සඳළුතල සහිත ගර්භ ගෘහ වලින් යුත් ප්‍රාසාදයක් කරවීම.
- විසිතුරු ප්‍රතිමා සහිත තුන්මහල් ප්‍රතිමා ගෘහයක් කරවීම.
- පිරිවෙන් හැත්තෑ පහක් හා දෙමහල් දිගු ප්‍රාසාද හැත්තෑ පහක් කරවීම.
- කුඩා ප්‍රාසාද එකසිය හැත්තෑ අටක්, ගෝපුර තිස් හතරක් සහ පුස්තකාල දෙකක් කරවීම.
- ගුහා ශාලා ගර්භ ගෘහ ආදියෙන් යුතු මල්කම් ලියකම් හා දිව්‍ය බ්‍රහ්ම රූපවලින් විචිත්‍ර වූ, තිවංක ප්‍රතිමා ගෘහය කරවීම. මෙය ගඩොලින් හා සුණු පිරියමින් කර තිබූ බව සඳහන් වේ.
- ධර්ම ශාලා තුනක් ද එක් චෛත්‍යක් ද දිග සක්මන් මළු අටක් හි දිගු පුළුලින් යුතු භෝජන ශාලාවක් කරවීම.
- උළු සෙවිලි කළ ගිනිහල් ගෙවල් අසූ පහක් හා වැසිකිලි එකසිය හැත්තෑ අටක් කරවීම.
- ග්‍රීෂ්ම කාලයේ භික්ෂුන්ට ස්නානය පිණිස, වටකුරු නාන පොකුණ, පියුම් හැඩැති නාන පොකුණ, භද්‍ර නාන පොකුණ ආදි වශයෙන් ශෛලමය නාන පොකුණු අටක් කරවීම.

අළාහණ පිරිවෙන ද තවත් විහාරාරාම සංකීර්ණයකි. රමණීය වූ කූටාගාර ගර්භගෘහ සදළුතල ආදියෙන් යුක්ත වූ

තෙමහල් ප්‍රාසාදයක් කරවන ලදි. එහිම දිගු ප්‍රාසාද හතලිහක් ද, වැසිකිලි හතලිහක් ද, කුඩා ප්‍රාසාද අටක් හා ප්‍රවේශ දොරටු හයක් ද, කරවන ලදි. රජුගේ මෙහෙසියන් දෙදෙනා විසින් සුභද්‍රා චෛත්‍යය ද, රූපවතී චෛත්‍යය ද කරවන ලදි

පරාක්‍රමබාහු රජතුමා විසින් පශ්චිමාරාමය කරවන ලදි. පිරිවෙන් විසි දෙකක් ද, දෙමහල් දීර්ඝ ශාලා විසි දෙකක් ද, ගිනිහල් ගෙවල් විස්සක් ද, දෙමහල් කුඩා ප්‍රාසාද හතලිහක් ද, එක් ධර්ම ශාලාවක් ද, වැසිකිලි තිස් පහක් ද, මෙම විහාරයට අවශ්‍ය සියලු පිරිකර සහිතව භික්ෂූන්ට පූජා කළ බවත් දැක්වේ. (අබයරත්න, 2012, පි. 156, 157) පරාක්‍රමබාහු රජුගේ ධූර කාලය තුළ බුදු දහම ඉතා සීඝ්‍රයෙන් දියුණු වූ අතර, බෞද්ධයන් ද සුරක්ෂිත වූ ආකාරය මෙමඟින් පැහැදිලි වේ.

I වන පරාක්‍රමබාහු රජතුමා දළදා වහන්සේ හා පාත්‍රා ධාතූන් වහන්සේ පොළොන්නරුවට වැඩමවා විවිධාකාරයේ පුද පූජා පවත්වා, ධාතු ප්‍රදර්ශනය කොට, අන් අය ලවා ද පූජා පැවැත්වීය. රජතුමා නගරයේ සුධර්මා දිව්‍ය සභාව බඳු දළදා මන්දිරයක් කරවූ බව සඳහන්වේ. පොළොන්නරු යුගයේ දී බුදු දහම පරිහානියට පත් වූව ද විජයබාහු හා පරාක්‍රමබාහු රජවරුන්ගේ අනුග්‍රහය ලැබුණු ආකාරයෙන් පැහැදිලි වන්නේ පොළොන්නරු යුගය තුළ බුදු දහම විරාජමානව පැවතුණු බවයි. බුදු දහම වැළඳ ගත් දෙමළ බෞද්ධයන්ද මෙරට සිටි බව සෙල්ලිපි වල සඳහන් වේ. ඒ බව දමෙඩ උපාසක, දමෙඩ හමන යනුවෙන් සඳහන් වීමෙන් තහවුරු වේ. දමිල භික්ෂූන් වහන්සේලා ද සිටි බව සඳහන් වීමෙන් තහවුරු වන්නේ, සැලකිය යුතු ප්‍රමාණයකට දමිල බෞද්ධයන් පිරිසක් ද සිටිය බවයි. (සෝමතිලක, 2017, පි 88)

### මහායාන බුදු දහම

මහායාන බුදු දහම ද පොළොන්නරුව යුගයේ පැවති බව සඳහන් වේ. අනුරාධපුර යුගයේ සිට මහායාන බුදු දහමේ යම් වර්ධනයක් තිබුණ ද පොළොන්නරු යුගය තුළ ද, මහායාන

බුදු සමයේ වර්ධනීය තත්ත්වයක් තිබුණ බව පැහැදිලිවේ. ධාතු වන්දනය පිළිම වන්දනය ට සමගාමීව පැවති විවිධ පුද පූජා හා උත්සව පැවැත් වූ ආකාරයෙන් ද ඒ බව තහවුරු කර ගත හැකිය.

මන්ත්‍ර පිරිවැහීම සදහා ධාරණී-සර නමැති ගොඩනැගිල්ලක් ද, බුදුන්ගේ ජාතක කතා පුවත් ශ්‍රවණය කිරීම සඳහා මණ්ඩල-මන්දිර නම් ගොඩනැගිල්ලක් ද, කරවූ බව චූලවංසය කියයි. මණ්ඩල-මන්දිරයෙහි ජාතක කතා දෙසීමට විශේෂයෙන්ම පත් කළ ආචාර්යවරයෙක් විය. ධාරණී සජ්ඣායන කිරීම සදහා තාන්ත්‍රික බෞද්ධයන් ධාරණී-සරයෙහි රැස්වූ බව දක්වේ. බ්‍රාහ්මණෙහි තතෝ සන්තිං කාරෙංතු හෙම මන්දිරං පරිවත්ත නත්ථං මන්තානං මනුඤ්ඤං ධාරණීසරං බ්‍රාහ්මණයන්ගේ ශාන්තිකර්ම හා මන්ත්‍ර සජ්ඣායන කිරීම සඳහා රුවන්මුවා මන්දිරයක් ද, ධාරණී සරයක් ද, මේ රජතෙමේ කරවිය. මෙහි දී අප විසින් සැලකිය යුතු කරුණක් නම් බ්‍රාහ්මණයන් ගැන දක්වා තිබෙන සහනයි. බෞද්ධාගමට හින්දු ආගමේ විශ්වාස හා පුද පිළිවෙත් ආදිය ඇතුළු වූයේ මේ කාලයේ දීය. ධාරණී සරය මන්ත්‍ර සජ්ඣායන කිරීම සඳහා පැවති බව අවධාරණයෙන් කර ඇත. විජ්ජාධර-ගුහා යන නාමය පවා තාන්ත්‍රික පුද පූජාවිධි සිහිපත් කරවන්නක් බව සඳහන් වේ. ධ්‍යානි බුද්ධ අමිතාභ සහ ස්තූපය යන සංකේත, අවලොකිතෙශ්වර හා මෛත්‍රීය බෝසත්වරු සිය ජටාව කූටවල දරන බව සාධනමාලාවෙහි ද කියැවිණි. (මුදියන්සේ, 1971, පිටු 135, 136, 140)

පරාක්‍රමබාහු රජුට තිබුණු නානා ප්‍රකාර උපාධිනාම අතරට "දුර්ලබ්ධිමථන" යන්නක්ද එකතු වී තිබුණු බව නිකාය සංග්‍රහයෙහි ප්‍රකාශිතයි. මේ රජුගේ ආගමික ප්‍රතිපත්තිය කෙබඳු වීද යනු මේ ගෞරව නාමය ගැන විමසුම් සහිත වීමෙන් පෙනී යනු ඇත. ථෙරවාදයට තර්ජනයක් වශයෙන් බුද්ධාගම තුළට වරින්වර ඇතුළත්වන්ට මාන බැලූ මිථ්‍යා අදහස් පිළිබඳව චූලවංස කතුවරයා විශේෂයෙන් සැලකිලිමත් වී විස්තර ඉදිරිපත් කරයි. දුර්-ලබ්ධි යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ හින්දු, ජෛන හෝ එබඳු අන්‍යාගම් නොව මහායානය නොහොත් වෛතුල්‍යවාදයයි.

වෛතුල්‍යවාදය විනා අන් කිසිම ආගමික බලවේගයක් ලක්දිව ථේරවාදයට තර්ජනයක් වී නොපැවැතිණ. අනුරාධපුර යුගයේ දී මහායාන බුදු සමය ආරම්භ වී පොළොන්නරු යුගයේ දී වර්ධනය වූ ස්වරූපයක් දක්නට වේ. මහායාන පුද පූජා ක්‍රමයන්හි සමානකතාවකින් යුතුව පැවති නිසා, ඝට්ටනයකින් තොරව ආගම් දෙකම පවතින්නට ඇතැයි සිතිය හැක.

**හින්දු දහම**

හින්දු චාරිත්‍ර වාරිත්‍ර ශ්‍රී ලාංකේය ජනයා අතර ඉතා හොඳින් ජනප්‍රිය වී තිබූ බවට සාක්ෂි රැසක් හමුවේ. පළමු වන විජයබාහු රජුගේ කාලයේ දී කන්තලේ පිහිටි ශිව දේවාලයක්, විජයරාජ ඊශ්වරම් යනුවෙන් නම් කොට, එහි කටයුතු හොඳින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අනුග්‍රහය සැපයූ බව පාලමොත්තායි දෙමළ සෙල්ලිපියෙහි වාර්තා කොට ඇත. එතුමා විසින් ඒ ආසන්නයේ පිහිටි හින්දූන්ගෙන් සමන්විත ජනාවාසයක් චතුර්වේදී මංගලම් ලෙස නම් කර ඇත. (ඉන්දිකා, 2015, පි. 93)

හින්දු ආගම ව්‍යාප්ත වීම සඳහා කරුණු 02ක් බලපෑම් කරන ලදි.

- ද්‍රවිඩ ආක්‍රමණ හා සංක්‍රමණ.
- සිංහල රජුන් විසින් ද්‍රවිඩ කුමාරිකාවන් ආවාහ කර ගැනීම.

දෙවනගල ශිලා ලිපියේ I වන පරාක්‍රමබාහු රජතුමාගේ ගුණ වර්ණනාවේ දී බෝසතුන් මෙන්ම ශිව, විෂ්ණු දෙවියන් වන්දනා කිරීමෙන් පැහැදිලි වන්නේ හින්දු ආගම තිබූ බවයි. ශිව, පාර්වතී, කාර්තිකේය, ගණ, නාථ, කාලි ලක්ෂ්මී ආදි දෙවියන්ගේ ප්‍රතිමා ගලින් සහ ලෝහයෙන් කර ඇති ප්‍රතිමා හමුවීමෙන් සනාථ වේ. (හෙට්ටිආරච්චි, 2004, පි. 370)

ලංකා ඉතිහාසය හැදෑරීමේ දී පත්තිනි දේවිය ඇදහීම ද, අනුරාධපුර යුගයේ සිටම පැවත ආ බව පැහැදිලි වේ. විදේශීය

දේවතාවියක් වූ පත්තිනි දේවිය පිළිබඳ මුලින්ම තොරතුරු හමුවන්නේ ගජබාහු රජුගේ රාජ්‍යය සමයේ දී ය. පත්තිනි දේවිය සතු උසස් ගුණයන්ගේ මහිමයෙන් අම්මාවරුන්ගේ ලෙඩ රෝග සුව වන බව විශ්වාසයයි. (ඉන්දිකා, 2015, පි. 164) ඒ අනුව ලෙඩ රෝග දුරු කර ගැනීම විෂයයෙහි පත්තිනි දේවිය ඇදහීම සිදු කර ඇතැයි සිතිය හැකිය.

පුරාවිද්‍යාත්මක කැණීම් මඟින් චෝළ හා පාණ්ඩ්‍යය සම්ප්‍රදායට අයත් ශිව හා විෂ්ණු දේවාල කිහිපයක් සොයා ගෙන ඇත. කාලි දෙවඟන පුදන ලද කාලි දේවාල කිහිපයක් පොළොන්නරුව අවටින් හමු වී ඇත. මේ අතුරින් ශිව දේවාල 07 ක් දැනට හඳුනාගෙන ඇති අතර, අංක 02 දරන ශිව දේවාලය වඩාත් හොඳින් ආරක්ෂා වී ඇත. එමෙන්ම චෝළ යුගයට නිශ්චිතවම දින නියම කළ හැකි දේවාංගයක් හැටියට හැඳින්විය හැකිය. පොළොන්නරුවේ විෂ්ණු දේවාල 05ක් සොයාගෙන ඇත. පොළොන්නරුවේ ද්‍රවිඩ ශිලා ලේඛනයන්හි අංක 02 දරන ශිව දේවාලය චෝළයන් විසින් වන වන් ම තේවීශ්වරම් යනුවෙන් හඳුන්වන ලද බව දක්වේ. රාජ රාජ ගේ බිසව වන වනවන්-ම තේවී මුල් කර ගෙන ඒ නම ලැබුණ බව සඳහන් වේ. චෝළ පාලකයන් හින්දු දේවාල ප්‍රතිසංස්කරණ කළ බවට මහාතිත්ථ වරාය ආසන්නයේ වූ තිරුඉරාමිශ්වරම් සහ රාජරාජේශ්වරම් යන හින්දු දේවාල දෙක ප්‍රතිසංස්කරණය කිරීමෙන් පැහැදිලි වේ. (සිරිවීර, 1971, පි. 39) චෝළ ශෛලියට අයත් තඹ හා ලෝකඩ පිළිම රාශියක් සහ ශිවලිංග කිහිපයක් හමු වී ඇත. වජ්‍රසත්ත්ව නම් ධ්‍යානි බුද්ධ ලෝහ ප්‍රතිමාවක් මැදිරිගිරියේ තිබී පුරාවිද්‍යා අධිකාරිය මඟින් සොයා ගනු ලැබු බව දක්වේ. අනුරාධපුර සමයේ සඳකඩපහන්වල ඇත්, අස්, සිංහ, අශ්වයා හා වෘෂභ රූප දක්නට ලැබේ. එහෙත් පොළොන්නරු යුගයේ දක්නට ඇති සඳකඩ පහනෙන් වෘෂභ රූපය බැහැර කරන ලදි. වෘෂභ සංකේතය හින්දූන්ගේ පූජනීය වස්තුවකි. ඒ නිසා චෝළ පාලනයෙන් පසුව පොළොන්නරුවේ සඳකඩ පහනෙන් වෘෂභ රූපය ඉවත් කරන ලදි. (සිරිවීර, 1971, පි. 41) හින්දු ආගමේ ආගමික සංකේතය වන්නේ ගවයාය. එම ආගමික සංකේතය තම පාද ස්පර්ශයට

හින්දූන් අකමැති විය. එම කරුණ පදනම් කර ගනිමින් සඳකඩපහණෙන් වෘෂභ රූපය ඉවත් වූ බව පෙන්වා දිය හැකිය. හින්දු ආගමේ බලපෑම කෙතරම් ද යන්න එමඟින් පැහැදිලි වේ.

ශිව හා වෙනත් දෙවිවරුන් සඳහා වූ දේවාලයන්හි වැඳුම් පිදුම් මෙහෙයවීම කරන ලද්දේ වෛදික හා ආගමික සම්ප්‍රදායයන් ප්‍රගුණ කළ පූජකවරුන් විසිනි. ඇතැම් ආගමික සිද්ධාන්තයන් හා ඒවායෙහි සම්ප්‍රදාය අනුව බොහෝ දුර බැහැරින් භක්තිකයන් පැමිණ තිබේ. භක්තිකයන් මාන්තොට තිරුකේතීශ්වරම් හා ත්‍රිකුණාමලයේ කෝණේෂ්වරම් දේවාලයන්වලට පැමිණි බව ප්‍රකටය. පල්ලව රජුන් දවස දකුණු ඉන්දියාවේ ශෛවාගමික පුනර්ජීවනයේ පුරෝගාමීන් විසින් රචිත තේවාරම් මෙරට හින්දු දේවාලවල ගායනා කළ බව සඳහන් වේ. (විජේතුංග 2012. පි. 213) පොළොන්නරුව යුගයට අයත් නටබුන් රාශියක් ශෛවාගමික ස්වරූපය ගත් බව දක්වයි. ඒවා ප්‍රධාන කොටස් 04ක් යටතේ වර්ගීකරණය කර ඇත.

- හින්දු ගොඩනැගිලිවල වාස්තු විද්‍යාත්මක නෂ්ටාවශේෂ
- ශෛලමය මූර්ති හා ලෝකඩ පිළිම
- අභිලේඛන
- අපූර්ව නිර්මාණ ලෙස සැලකිය හැකි කාසි හා මුද්‍රා

හින්දු ආගමේ ප්‍රවර්ධනයට බලපෑ ප්‍රධාන ධාරා 04කි.

- සමකාලීන දක්ෂිණ ඉන්දියාවේ හින්දු ආගම තුළ හටගත් වර්ධනයන්
- ලංකාව සමඟ වෙළඳ කටයුතුවල දී අධිකාරී තත්ත්වයක සිටි දකුණු ඉන්දියානු වෙළඳ ශ්‍රේණි
- ලංකාව, දකුණු ඉන්දියානු හා කාලිංග රජ පවුල් අතර පැවති විවාහ සබඳතා

- කාව්‍ය, රාජ්‍යත්වය හා රාජ්‍යය පාලනය පිළිබඳ ආගමික නොවන හින්දු සාහිත්‍යය ග්‍රන්ථ පරිශීලනය කිරීම හරහා ගලා ආ චින්තනමය ප්‍රබෝධයයි. (විජේතුංග 2012. පි. 214)

හින්දු ආගම පිළිබඳ රජුන්ගේ කාර්යයභාරය එහි භාරකාරත්වය ට සීමා විය. ඉතා දැඩි බෞද්ධ භක්තික රජකු ලවා හින්දු දෙවියන්ට පුද පූජා පැවැත්වීමටත් හින්දු සිද්ධස්ථානයන්ට අනුග්‍රහ දැක්වීමටත් බාධාවක් නොතිබිණ. එවැනි ක්‍රියාවන් බුදු දහමට හානිකර සේ නොසැලකිණ. 11 සහ 12 සියවස්වල අගනුවර රජවාසල තුළ හා ඊට පිටතත්, හින්දු බලපෑම්වලින් ගහණ විය. හින්දු ආචාර ධර්ම රජවාසල ට ආගන්තුක නොවූ අතර, රාජ්‍යත්වය පිළිබඳ අදහස් හා මුසු වී භාවිතයට එක් විය. (විජේතුංග 2012. පි. 219) විජයබාහු රජුගේ දෙවන අගමෙහෙසිය වූ කාලිංග කුමාරිකාවක් වූ තිලෝකසුන්දරී ද ශීව භක්තියට හා පුද පූජා වලට නැඹුරුව සිටියහ. හින්දු ආගමික හා බෞද්ධාගමික ලක්ෂණ පොළොන්නරුව යුගය තුළ සමාන විය. (Silva, 2005, P 204)

දෙවන වික්‍රමබාහු, දෙවන ගජබාහු හා මානාභරණ කුමරු ශීව ආගම කෙරෙහි දැඩිව පැහැදි සිටියහ. දෙවන ගජබාහු හින්දු දෙවියන් සඳහා පුද පූජා පැවැත් වූ අතර, ස්කන්ධ හා වෙනත් දෙවිවරු වෙනුවෙන් හින්දු වත් පිළිවෙත් සිදු කළහ. මහා පරාක්‍රමබාහු රජතුමා ද හින්දු ආගමට අනුග්‍රහ දැක්වූ බව මහාවංශය සාක්ෂි දරයි.

**බ්‍රාහ්මණ ආගම**

වංසකථාවේ දැක්වෙන තොරතුරු අනුව රජු බ්‍රාහ්මණයන් ලවා ශාන්ති කර්ම කරවීම සඳහා රනින් මැදුරක් කරවූ අතර මන්ත්‍ර ජප කිරීම සඳහා සිත්කළු ධාරණී ගෘහයක් ද කරවා ඇත. යටාලතිස්ස රජු උපුල්වන් දෙවියන්ගේ දිව්‍ය මන්දිරය සර්ව භෝගයන්ගෙන් යුක්තව ප්‍රතිසංස්කරණය කරන ලදි. පසුව දෙවිනුවර අවුරුදු පතා ඇසළ පෙරහැර පැවැත්වීමට නියෝග

කරන ලදි. (මහාවංශය, පි 415) නිශ්ශංකමල්ල රජු ද වැදුම් පිදුම් සඳහා දේවාල වලට ගියේය. බමුණන් ට හා දේවාලයන්ට පුද පඬුරු පූජා කළේය. රජතුමා විසින් කන්තලේ පාර්වතී නම් දාන ශාලාවක් පිහිටවනු ලැබීය. උත්සව කාල වලට නැටුම්, ගැයුම් බැලු බවත් බමුණන් සඳහා දාන ශාලා විවෘත කළ බවත් සඳහන් වේ.

ලක්දිව හටගත් දුර්භික්ෂ සමයේ මහජනතාව බියපත්ව තෙරුවන්ට ද, චෛත්‍යයටද, බෝධියටද, නාථ, මෛත්‍රී දේවා දී පූජනීය දෙවියන්ට ද නන්වැදෑරුම් පූජාවෙන් පූජා කරවා, භික්ෂූන් එක් රැස් කොට පිරිත් සජ්ඣායනය කොට දළදා වහන්සේ නුවර ප්‍රදක්ෂිණා කරවා වැසි වසීවායි අධිෂ්ඨාන කළහ. (මහාවංශය, පි 421)

චෝළ ආක්‍රමණ මඟින් මෙරටට තිබු වෙහෙර විහාර කඩා බිඳ දමා සම්පත් ස්වකීය රටේ ඇති ආගමික මධ්‍යස්ථානවල ප්‍රයෝජනය සඳහා යොදා ගත් බව සඳහන්වේ. එකල චෝළ අගනුවර තඤ්ජිවූර් (තැන්ජෝර්) පිහිටි දේවාලයක නඩත්තුව සඳහා එරට ගම්වර කිහිපයක ආදායම වෙන් කළ බව රාජ රාජ නම් චෝළ රජුගේ 29 වන රාජ වර්ෂයේ පිහිට වූ ශිලා ලිපියක සඳහන් වේ. ඔවුන්ගේ ආගමික අවශ්‍යතා සපුරනු ලැබුවේ කෝවිල් මඟිනි. චෝළ පාලකයන් වෙහෙර විහාර විනාශ කළ ද, තෝරා ගත් වෙහෙර විහාරවලට යම්යම් දායකත්වයන් සැපයූ බවට සාධක හමුවේ. (සද්ධානන්ද හිමි, 2018. පි 110)

**ඉස්ලාම් ආගම**

හින්දු සමයට අමතරව ඉස්ලාම් ආගම ද 12, 13 වැනි ශත වර්ෂවල අනුක්‍රමයෙන් කොළඹ, බේරුවල, හලාවත, වැලිගම හා ගාල්ල වැනි වරායන්හි වෙළඳ කටයුතු වල නිරත වූ මුස්ලිම් ජන කොට්ඨාසයන් හි ආගම වුයේ ඉස්ලාම් දහමය. මෙම මුස්ලිම් ජන කොට්ඨාස ඒ ඒ ස්ථානයන්හි දේවස්ථාන ඉදිකොට ඔවුන්ගේ ආගමික කටයුතු සිදු කරන ලදි. (Siriweera W. I, p. 25)

## සමාලෝචනය

මෙම පර්යේෂණයේ දී තහවුරු කර ගත හැකි වූයේ බුදු දහම, මහායාන බුදු දහම, හින්දු දහම හා ඉස්ලාම් යන ආගම් පොළොන්නරුව යුගය තුළ පැවති බවයි. එම කාල පරිච්ඡේදය තුළ රටේ පැවති ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් මහජනයා ද, තම ආගමික ප්‍රතිපත්තිය වෙනස් කළ අයුරු පැහැදිලි වේ. විවිධ රජවරු ඒ ඒ ආගම් විෂයයෙහි ලබා දෙන අනුග්‍රහයන් සමඟ ජනතාවද, විවිධ ආගමික ප්‍රතිපත්තීන් අනුගමනය කළ බව, බුදු දහම පරිහානිකර තත්ත්වයේ තිබූ වකවානුවේ දී හින්දු දහමේ වැඩී වීම තුළින් සනාථ කර ගත හැකිය. I වන විජයබාහු හා I වන පරාක්‍රමබාහු රජවරුන් වැඩි වශයෙන් දායකත්වය සැපයූ බවත්, මහායාන බුදු දහම ද, මෙම කාල වකවානුව තුළ විරාජමාන වූ බවත් සඳහන් කළ හැකිය. හින්දු දහම ඉතාම සීඝ්‍රයෙන් ප්‍රචලිත වෙමින් බුදු දහම පවා අතික්‍රමණය කළ ආකාරය පොළොන්නරු යුගයේ දී හමු වූ නටබුන් තුළින් පැහැදිලි වේ. වෙළදාම් සඳහා සංක්‍රමණය වූ ඉස්ලාම් බැතිමතුන් ඔවුන් වෙළදාම් සිදු කරන ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් තම ආගම ඇදහූ බව පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

*මහාවංශය*, (1959). සංස්: පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959.

### ද්විතීයික මූලාශ්‍රය

සෝමතිලක, මහින්ද. (2017). *ශ්‍රී ලාංකේය ඉතිහාසයෙහි ඉන්දියානු සාධකය*, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ(පුද්) සමාගම.

අබයරත්න, හරිශ්චන්ද්‍ර. (2012). *පොළොන්නරුව (මහාවංශය පදනම් කර ගත් විමර්ශනයක්)*, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ(පුද්) සමාගම.

දිවාකර, අනුරින් ඉන්දිකා.(2015). *සෙල් ලිපි හා සන්නස් වලින් හෙළිවන ලංකාවේ සමාජය*, කොළඹ 10: සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ (පෞද්) සමාගම.

මුදියන්සේ, නන්දසේන. (1971). *ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය*, කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ(පුද්) සමාගම.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති. (1971). *මධ්‍යතන ලංකාව*, කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

ධම්මවිසුද්ධි හිමි, යටදොලවත්තේ. (1995). *පොළොන්නරුව හා දඹදෙණි කතිකාවත්*, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

*ශ්‍රී ලාංකේය ඉතිහාසය (වෙළුම 11)*, ඩබ්. එම්. කේ. විජේතුංග සංස්, කොලඹ 11ඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2012.

*සංක්ෂිප්ත ලංකා ඉතිහාසයක්*, ඇස්. බී. හෙට්ටිආරච්චිඃ සංස්, නුගේගොඩඃ මැන්දිස් රෝහණ පර්යේෂණ පදනම, 2004.

*පුරාවිද්‍යා ශාස්ත්‍රීය සංග්‍රහය*, බැරගම සද්ධානන්ද හිමි, කදිරපුර පඤ්ඤානන්ද හිමි, තෙනගල්ලන්දේ සාරානන්ද හිමිඃ සංස්, ශ්‍රි ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, 2018.

Silva. K. M. De. (2005). *A History of Sri Lanka*, Colombo 04: Vijitha Yapa Publication.